**දඹුල්ල ප්‍රාදේශීය සභාව**

**-----------------------------**

**මාතලේ දිස්ත්‍රික්කය**

**---------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**----------------**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**------------------------------------**

**2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 30 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 දින ද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.**

1.2 **තත්ත්වාගණනය කළ මතය**

**----------------------------------**

**මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට දඹුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම් කරන මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

1.3 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------------**

(අ) **ගිණුම්කරණ අඩුපාඩු**

**---------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | **2017 වර්ෂයේ කර්මාන්ත ණයගැතියන් රු.49,040 කින් අඩුවෙන් දැක්වීම නිවැරදි කිරීමේදී සමුච්චිත අරමුදල හර කර ණයගැතියන් බැර කිරීම හේතුවෙන් එම ගිණුම් දෙකම රු.98,080 බැගින් අඩුවෙන් දැක්වුණි.** | **ගිණුම් නිවැරදි කළ යුතු වේ.** | **2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි.** |

| | | | |
|---|---|---|---|
| (ii) | විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන වැඩසටහන යටතේ කර්මාන්ත 05 කට අදාළව කර්මාන්ත ණයගැතියන් රු.2,115,018 ක් හා කර්මාන්ත 03 කට අදාළව කර්මාන්ත ණයහිමියන් රු.2,121,705 ක් වැඩියෙන් දැක්වුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (iii) | පිදුරංගල ගම මැද පාර සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ ණයහිමි වටිනාකම 1,200,000 ක් වැඩියෙන් දැක්වුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (iv) | රු.1,500,000 ක් වූ සනීපාරක්ෂක වැසිකිළියේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (v) | රු.115,330 ක් වටිනා යන්ත්‍ර උපකරණ හා ලී බඩු සහ සවිකිරීම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (vi) | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ කර්මාන්ත 24 කට අදාළව කර්මාන්ත ණයහිමියන් රු.25,977,222 ක් අඩුවෙන් දැක්වුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ 02 ක වටිනාකම හා එම ගිණුම් ශේෂවලට අදාළ උපයෝගී ලේඛන අතර රු.17,838,538 ක අසමානතාවයක් විය. | ගිණුම් ශේෂ සහ උපයෝගී ලේඛනවල ශේෂ සසඳා නිවැරදි කළ යුතු වේ. | අදාළ ගිණුම් නිවැරදිව සිදු කරන බව දන්වමි. |

(ඇ) අවිනිශ්චිත ගිණුම

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පසුගිය වර්ෂයේ අවසානයට තිබුණු රු.12,587,598 ක අවිනිශ්චිත ගබඩා ගිණුමේ හර ශේෂය නිරවුල් නොකර ඉදිරියට ගෙනවිත් තිබුණි. | අවිනිශ්චිත ගබඩා ගිණුමේ ශේෂය ඇතිවීමට වූ හේතුන් සොයාගෙන නිවැරදි කළ යුතු වේ. | ප්‍රාදේශීය සභාව ආරම්භක කාලය සිටම ගබඩා ලැබීම් ගබඩා ගිණුමට ඇතුලත් කර ඇති නමුත් නිකුත් කිරීමේ නියෝග මඟින් නිකුත් කළ භාණ්ඩ වල වටිනාකම ගිණුමෙන් ඉවත් කර නොතිබීම හේතුවෙන් ගබඩා ගිණුමේ ශේෂයට අදාළ උප ලේඛන සකස් කර නොමැත. එබැවින් දැනට ගබඩා ගිණුමේ ශේෂය අවිනිශ්චිත ගිණුමක් ලෙස වෙනම පෙන්වා වර්ෂයට අදාළ ලැබීම් හා නිකුත් කිරීම් අනුව වෙනම ගිණුමක් සකස් කර ඇති බව දන්වා ඇත. |

(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.41,243,599 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාළව පිළිගත හැකි සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල ගිණුම් ශේෂ තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | පිලිතුරු ලබා දී නොමැත. |

1.4 අනුකූල නොවීම

-------------------

1.4.1 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 1.6 වගන්තිය | ස්ථාන මාරු වී ගිය නිලධාරිනියකගෙන් අයවීමට ඇති රු.252,460 ක ණය මුදලක් අයකර නොතිබුණි. | හිඟ සේවක ණය අයකරගත යුතු වේ. | හිඟ සේවක ණය අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104(1) | වාහන 02 ක් සමාලෝචිත වර්ෂයේදී අනතුරකට ලක්ව තිබුණු අතර පරීක්ෂණ සිදු කර වගකිව යුත්තන් නිශ්වය කර නොතිබුණි. | මු.රෙ ප්‍රකාරව වගකිව යුත්තන් නිශ්වය කර ගැනීම. | පරීක්ෂණ ආරම්භ කිරීම සඳහා විමර්ෂණ නිලධාරියෙකු පත්කර එවන ලෙසට ඉල්ලීම් කර ඇත. |
| (ඇ) | 2018 දෙසැම්බර් 28 දිනැති අංක 2104 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය | දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය දියුණු කල ප්‍රදේශයක් වශයෙන් හඳුනාගෙන තිබුණද වරිපනම් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | වරිපනම් අයකර ගැනිමට කටයුතු කළ යුතු වේ. | වරිපනම් කලාපයක් ලෙස හඳුනා ගෙන අදාල තොරතුරු සිතියම් ගත කර ඇති අතර තක්සේරු කරණයෙන් පසු වරිපනම් අයකිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

------------------------

### **2.1** මූල්‍ය ප්‍රතිඵල

--------------

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ අදායම රු.29,922,945 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.26,149,682 ක් විය.**

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

**සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,000,000 | 2,000,000 | - | 2,000,000 | - | - | - | - |
| කුලී | 2,145,000 | 2,402,542 | 2,402,542 | - | 1,950,000 | 1,965,000 | 1,965,000 | - |
| බලපත්‍ර ගාස්තු | 26,687,550 | 27,203,607 | 26,010,278 | 1,193,329 | 16,426,150 | 16,459,450 | 15,958,699 | 500,751 |
| වෙනත් ආදායම් | 46,481,800 | 24,331,307 | 12,014,375 | 12,316,932 | 25,528,250 | 22,768,600 | 14,683,030 | 8,085,570 |
| එකතුව | 77,314,350 | 55,937,456 | 40,427,195 | 15,510,261 | 43,904,400 | 41,193,050 | 32,606,729 | 8,586,321 |

2.2.2 ටෙන්ඩර් ගාස්තු

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රථ වාහන ගාල් කරන ස්ථාන 02 කින් වසර 15 ක් තිස්සේ අයවිය යුතු ටෙන්ඩර් ගාස්තු රු.1,029,120 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ ටෙන්ඩර් ගාස්තු කඩිනමින් අයකර ගත යුතු වේ. | තොරතුරු සොයාගත් විගස අයකිරීම් කරන බව දන්වමි. |

2.2.3 බලපත්‍ර ගාස්තු

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු සංචාරක හෝටල් බදු රු.914,529 ක් පරිසර බලපත්‍ර ගාස්තු රු.97,800 ක් හා දැන්වීම් පුවරු ගාස්තු රු.181,000 ක් හිඟව පැවතුණි. | හිඟ ගාස්තු අයකර ගත යුතු වේ. | අදාළ හිඟ ගාස්තු වලින් මේ වන විට රු.1,014,729 ක් අයවී ඇති අතර නොගෙවූ හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්ය සාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශිය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 වන විටත් කාරණා 19 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | සියළු අතුරු ව්‍යවස්ථා පනවා සභාවේ කටයුතු කාර්යක්ෂමව සිදුකළ යුතු වේ. | මේ වන විට අතුරු ව්‍යවස්ථා පැනවීමට ඇති කාරණා සම්බන්ධයෙන් ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා 2019 වර්ෂය තුළදී කෙටිකාලීන වියදම් වශයෙන් රු.7,791,677 ක වියදමක් දරා තිබුණු අතර නොදිරන ද්‍රව්‍ය විකිණීමට හෝ ක්‍රමවත්ව බැහැර කිරීමට සුදුසු වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | කසළ කළමනාකරණය නිසි ලෙස ඉටු කළ යුතු වේ. | නොදිරන ද්‍රව්‍ය ක්‍රමවත්ව වෙන් කර බැහැර කරන ස්ථානයට ලබා දීමට කටයුතු කරන බව දන්වමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2013 වර්ෂයේදී බදු දී තිබූ සීගිරිය රථ වාහන නැවතුම්පල කුලී වශයෙන් අයවීමට තිබූ රු.398,294 ක මුදල ගෙවීම පැහැර හැරීම හේතුවෙන් | නීතිමය කටයුතු කඩිනමින් අවසන් කර හිඟ කුලී අයකර ගත යුතු වේ. | ගොනු කර තිබූ නඩුව විත්තිකරු පෙනී නොසිටීම හේතුවෙන් අදාළ නඩුව බහා ( MR – 327 ) තබා තිබූ |

| | | |
|---|---|---|
| අදාළ බදුකරුට විරුද්ධව පවරා තිබූ නඩුව සම්බන්ධයෙන් ඉදිරි කටයුතු ආරම්භ කර නොතිබුණි. | | අතර ඇපැලක් මඟින් නැවත විභාග කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇති බව දන්වමි. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මඟින් අනාවරණය කරගත් රු.389,195 ක ඌනතාවය සම්බන්ධව මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මු.රෙ ප්‍රකාරව වගකිව යුත්තන් නිශ්චය කර ගත යුතු වේ. | මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 පරීක්ෂණයක් සිදු වෙමින් පවතින බැවින් ඒ අනුව ඉදිරියට කටයුතු කරන බව දන්වමි. |

3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 10 ක පුරප්පාඩු 17 ක් විය. | පුරප්පාඩු සම්පූර්ණ කරවාගත යුතු වේ. | දක්වා ඇති තනතුරු බඳවා ගැනීමට මේ වන විටත් කටයුතු යොදා ඇත. |
| **(ආ) සේවක ණය** | | |
| ස්ථාන මාරු වී ගිය නිලධාරිනියකගෙන් අයවීමට ඇති රු.252,460 ක සේවක ණය මුදල අයකර නොතිබුණි. | සේවක ණය කඩිනමින් අයකර ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.5 **වත්කම් කළමනාකරණය**

**-----------------------------**

3.5.1 **නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**--------------------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **------------------------** | **----------** | **-----------------------------** |
| **සභාව සතු වාහන 05 ක් නිෂ්කාර්යව පැවතුණි.** | **නිශ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම් අපහරණය කිරීමට හෝ සුදුසු වෙනත් ක්‍රියාමාර්ගයක් ගත යුතු වේ.** | **මෙම යන්ත්‍ර සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කරමි.** |

3.6 **ප්‍රසම්පාදනය**

**--------------**

**3.6.1** **සැපයීම් හා සේවා**

**--------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **------------------------** | **----------** | **-----------------------------** |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ 3.4.(3)(ඇ) යටතේ වෙළඳපාල මිල සැඳහුම් ක්‍රමය යටතේ මිලදී ගැනීම් කිරීමේදී ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ලැයිස්තුවෙන් දැක්වෙන ආයතන වලට පමණක් සීමා කළ යුතු බව දක්වා තිබුණ ද එසේ කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ අවස්ථා 04 කදී එකතුව රු.754,535 ක් වටිනා භාණ්ඩ හා උපකරණ මිලදී ගෙන තිබුණි.** | **ලියාපදිංචි ආයතන වලට ප්‍රමුඛතාවය ලබාදිය යුතු වේ.** | **පිළිගනිමි. මෙම මිලදී ගැනීම් වලින් විදුලි භාණ්ඩ හා ටයර් මිලදී ගැනීම සිදු කර ඇත්තේ ලියාපදිංචි ආයතන වලින් බව දන්වමි.** |